**කෝරළෙයි පත්තු ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෝරළෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උප වගන්තිය 172(1) සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට කෝරළෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණු රු.1,077,106 ක් වටිනා පොත් 3401 ක වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව. | පරිත්‍යාග පොත් වත්කමක් වශයෙන් ගිණුම්වල දැක්විය යුතුය. |
| (ආ) | සංචාරක හෝටල් 12 කින් අයවිය යුතු ඝණ අපද්‍රව්‍ය ඉවත්කරීමේ බදු රු.5,215,000 ක් සහ කෝරළෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයවිය යුතු රු. 188,884 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | හිඟ ආදායම් වත්කමක් වශයෙන් දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ වටිනාකම් සඳහන් නොවූ පාරිභෝගික භාණ්ඩ 145 ක් සහ රු. 176,649 ක් වටිනා විදුලි බුබුළු තොගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | තොග ගිණුම්වල වත්කම් වශයෙන් දැක්විය යුතුය. |
| (ඈ) | ඒරාවූර්පත්තුව ප්‍රාදේශීය සභාවේ කොඩුවාමඩු ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ පොලිතීන් සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ඝණ අපද්‍රව්‍ය ගාස්තුව රු.139,825 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | ගෙවිය යුතු මුදල් වගකීමක් වශයෙන් දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අවසානයේ භාණ්ඩ වර්ග 165 ක් රු.63,049 ක වටිනාකමට වෙන්දේසි කර තිබූ නමුත් ඒවායෙහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | -එම- | වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්විය යුතුය. |
| (ඊ) | 2020 වර්ෂය සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය කළ යුතු සංචාරක හෝටල් බදු ආදායම් රු. 600,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ එය ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් වත්කමක් ලෙස දැක්විය යුතුය. |
| (උ) | පෞද්ගලික දුරකථන සමාගම් 05 කින් 2019 සිට 2021 වර්ෂය දක්වා අය විය යුතු ව්‍යාපාර බලපත්‍ර ගාස්තු රු.138,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් වත්කමක් ලෙස දැක්විය යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.25,548,271 ක් වටිනා ගිණුම් ශේෂ 06 ක් ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන සහ අයිතිය තහවුරු කිරීමේ ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | වත්කම් සම්බන්ධයෙන් ලියවිලි පවත්වා ගෙන යන ලබන අතර, අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල ලේඛන ලබා ගෙන ලේඛන ගත කිරිමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය 24(1) හා මඩකලපුව දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස්ගේ අංක BT/ACLG/PL/Road/2013 සහ 2013 ජූලි 10 දිනැති ලිපිය | විගණන දිනය දක්වා සභාවේ මාර්ග ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කරන බව. | මාර්ග ගැසට්පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය 127 ප්‍රකාරව ආදාහන ස්ථානය සහ සුසානභූමි ආඥා පනතේ වගන්තිය 3 | සභාව විසින් සමාලෝචිත වර්ෂයේදි මහජන සුසාන භූමියේ අනුස්මරණ ස්මාරක 36 ක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද, අනුස්මරණ ස්මාරක ඉදිකිරීමට අදාලව ලේඛනයක් සභාව විසින් පවත්වා නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අනුස්මරණ ස්මාරක ඉදිකිරීම් සඳහා අවසර ලබා දීම සම්බන්ධයෙන් ලේඛන පවත්වා ගෙන යායුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 60,660,398 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 22,693,671 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,790,000 | 873,150 | 873,150 | - | 1,700,000 | 458,628 | 458,628 | - |
| කුලී | 11,934,000 | 8,230,835 | 7,620,649 | 18,399,540 | 14,507,000 | 4,123,184 | 5,418,006 | 17,789,354 |
| බලපත්‍ර ගාස්තු | 3,764,000 | 6,203,421 | 6,202,421 | - | 3,719,000 | 5,293,805 | 5,293,805 | - |
| වෙනත් ආදායම් | 32,838,000 | 82,331,253 | 76,882,874 | 7,954,014 | 28,130,000 | 82,770,683 | 81,760,048 | 2,505,635 |
| **එකතුව** | 50,326,000 | 97,638,659 | 91,579,094 | 26,353,554 | 48,056,000 | 92,646,300 | 92,930,487 | 20,294,989 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී**<br>2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා හිඟ බදු කුලී ආදායම් රු. 16,445,871 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාරික ස්ථාන 87 කින් ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 130,500 ක මුදල සභාව විසින් අයකර නොතිබුණි. | -එම- | ව්‍යාපාරික ස්ථානවලින් වර්ෂය සඳහා අයවිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගත යුතුය. |
| (ii) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපන ශාලා සහ නවාතැන්වල දළ වෙළඳ ආදායමෙන් සියයට එකකට නොඉක්මවන බලපත්‍ර ගාස්තුවක් අයකර ගත යුතු වුවත් සභා බලප්‍රදේශයේ ලියාපදිංචි සංචාරක සේවා සපයන ආයතන 14 කින් රු.100,000 ක් ස්ථාවර බලපත්‍ර ගාස්තුවක් අයකර තිබුණද, පනතේ විධිවිධාන අනුව ආදායම් අයකර නොතිබුණි. | -එම- | පනත ප්‍රකාරව ආදායම් අයකර ගත යුතුය. |
| (ඇ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 7,417,241 ක් විය. | -එම- | මුද්දර ගාස්තු ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | **වෙනත් ආදායම්**<br>බදුකුලී ගිවිසුම අනුව ප්‍රමාද ගාස්තු ලෙස හිඟ බදුකුලී රු. 17,082,390 ක් සඳහා සියයට 10 ක දඩ මුදලක් අයකර නොතිබුණි. | -එම- | දඩ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ලියාපදිංචි ප්‍රජා මධ්‍යස්ථාන 33 ක් තිබුණද, 13 ක් පමණක් ක්‍රියාකාරි තත්ත්වයේ පැවතුණි. ක්‍රියාකාරි තත්ත්වයේ නොමැති ප්‍රජා මධ්‍යස්ථාන ක්‍රියාකාරි තත්ත්වයට දියුණු කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කර ඇති බව. | ප්‍රජා මධ්‍යස්ථාන ක්‍රියාකාරි තත්ත්වයට දියුණු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 සහ සමාලෝචිත වර්ෂයේ මඩකලපුව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබුණ පරිගණක සහ උපාංග වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් වශයෙන් දක්වා නොතිබුණි. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පරිත්‍යාග වත්කම් ගිණුම්වල දැක්විය යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂ පහකට වැඩි කාලයක් සභාව සතු අළුත්වැඩියා කළ යුතු තත්වයේ වාහන 14 ක් අළුත්වැඩියා කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | වාහන අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවර්ධන කටයුතු සඳහා 2017 වර්ෂයේදි ලැබුණ රු.750,000ක මුදලක් අදාළ අරමුණු වලට යොදා නොගෙන සමාලෝචිත වර්ෂය අවසාන දිනට තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කර ඇති බව. | ව්‍යාපෘති අදාල කාල පරිච්ඡේදයතුල නිම කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ අංක 4.2.2 ප්‍රකාරව, ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 55 දී රු. 11,015,050 ක ප්‍රසම්පාදන සිදු කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහන සකස් කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **සේවක පුරප්පාඩු සහ අතිරික්ත**<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලයහි තනතුරු 08 ක පුරප්පාඩු 28 ක් සහ අතිරික්ත 04 ක් විය. | මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව. | සේවක පුරප්පාඩු පිරවීමට සහ අතිරික්තය විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) **සේවක ණය**<br>සභාව විසින් සේවකයන් වෙත ලබා දෙන ලද ආපදා ණය සහ අනෙකුත් ණය සම්බන්ධයෙන් අදාල අයගෙන් අයවිය යුතු රු. 204,573 ක මුදල වර්ෂ 10 ක කාලය සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ සේවක ණය අයකළ යුතුය. |

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ අංක 56 දරණ පනතෙන් සංශෝධනය කරන ලද 1980 අංක 47 දරණ ජාතික පාරිසරික ආරක්ෂක පනත අනුව ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍රයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබා ගෙන නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |